# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2071/57 - 2018 මැයි මස 16 වැනි බදාදා - 2018.05.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදනයයි

එල්. ඩී. බී. 3/2012

**2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත**
**48(1) වන වගන්තිය යටතේ වූ නියමය**

2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 48 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය ජෝන් ඇන්තනී ඉමැනුවෙල් අමරතුංග වන මා විසින්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිර්දේශය මත මෙහි උපලේඛනයේ I වන කොටසේ නිශ්චිතව දක්වන ලද ව්‍යවසායන් හා මෙහි උපලේඛනයේ II වන කොටසේ නිශ්චිතව දක්වන ලද සේවා පිළිවෙලින් සංචාරක ව්‍යවසායන් හා සංචාරක සේවා ලෙස මෙම නියමය මගින් ප්‍රකාශයට පත් කරමි.

**ජෝන් අමරතුංග,**
සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි
ආගමික කටයුතු අමාත්‍ය,

2018 මැයි 09 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

I කොටස

සංචාරක ව්‍යවසායන්

1. හෝටල්
2. ආගන්තුක නිවාස
3. සත්කාරක නිවාස ඒකක


1A- G 27664 - 17 (2018/05)



*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. සංචාරක බංගලා කුලියට ගත් නිවාස, පෞරාණික බංගලා, පෞරාණික නිවාස
5. සංචාරක කුලී මහල් නිවාස
6. මහල් නිවාස හෝටල්
7. කුඩා සුවපහසු හෝටල් (බුටික් හෝටල්/බුටික් විලා)
8. ආයුර්වේද හෝටල්
9. පෞරාණික හෝටල්
10. ස්වාධීන සංචාරක අවන්හල්
11. සංචාරක වෙළඳසල්

## II කොටස

### සංචාරක සේවා

1. සංචාරක කළමනාකරණ සමාගම්
2. සංචාරක ආයුර්වේද සත්කාරක සේවා මධ්‍යස්ථාන
3. සංචාරක මාර්ගෝපදේශන සේවා
4. සංචාරක යාත්‍රා මෙහෙයුම්
5. කුළු බඩු උද්‍යාන හා විකුණුම් මධ්‍යස්ථාන
6. ජලාශ්‍රිත ක්‍රියාකාරකම්
7. ස්පා සහ ශරීර සුවතා මධ්‍යස්ථාන
8. වාහන සෆාරි චාරිකා මෙහෙයුම්කරුවන්
9. ඇතුන්පිට-සෆාරි චාරිකා මෙහෙයුම්කරුවන්

06 - 151/1

---

එල්. ඩී. බී. 3/2012

**2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත**

**48(5) වන උප වගන්තිය යටතේ වන නියමය**

2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 48 වන වගන්තියේ (5) වන උප වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය ජෝන් ඇන්තනී ඉමැනුවෙල් අමරතුංග වන මා විසින්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිර්දේශය මත මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව සඳහන් කර ඇති සංචාරක ව්‍යවසායන් හෝ සංචාරක සේවාවන් සඳහා බලපත්‍ර ලබා ගැනීමකට, ලියාපදිංචි කිරීමකට හෝ එවැනි බලපත්‍රයක් අලුත් කිරීමක් සඳහා අයදුම් කරනු ලබන සෑම අයදුම්කරුවකු විසින් ම මෙහි උපලේඛනයේ අනුරූප තීරවල නිශ්චිතව සඳහන් කර ඇති සංචාරක ව්‍යවසායන් සහ සංචාරක සේවා සඳහා බලපත්‍රයක් ලබාගැනීමට ලියාපදිංචි කිරීමකට සහ එවැනි බලපත්‍රයක් අලුත් කිරීමකට අදාළ ගාස්තු ගෙවිය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

**ජෝන් අමරතුංග,**
සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි
ආගමික කටයුතු අමාත්‍ය,

2018 මැයි 09 වැනි දින,
කොළඹ දී ය.

## උපලේඛනය

| අංකය | *I වන තීරය* | | *II වන තීරය* | *III වන තීරය* | *IV වන තීරය* |
|---|---|---|---|---|---|
| | සංචාරක ව්‍යවසායන් | | *ලියාපදිංචි ගාස්තු (රු. ශ.)* | *බලපත්‍ර ලබාගැනීමේ ගාස්තු (රු. ශ.)* | *අලුත් කිරීමේ ගාස්තු (රු. ශ.)* |
| 1. | හෝටල් | කාමර 25ක් හෝ ඊට අඩු | 24,000 | 12,000 | 12,000 |
| | | කාමර 26 - කාමර 50 | 24,000 | 18,000 | 18,000 |
| | | කාමර 51ක් හෝ ඊට වැඩි | 24,000 | 24,000 | 24,000 |
| 2. | ආගන්තුක නිවාස | A ශ්‍රේණිය-කාමර 1-10 | 12,000 | 6,000 | 6,000 |
| | | A ශ්‍රේණිය-කාමර 11 හෝ ඊට වැඩි | 12,000 | 9,000 | 9,000 |
| | | B ශ්‍රේණිය-කාමර 1-10 | 12,000 | 4,800 | 4,800 |
| | | B ශ්‍රේණිය-කාමර 11ක් හෝ ඊට වැඩි | 12,000 | 6,000 | 6,000 |
| | | C ශ්‍රේණිය-කාමර 1-10 | 12,000 | 3,600 | 3,600 |
| | | C ශ්‍රේණිය-කාමර 11 හෝ ඊට වැඩි | 12,000 | 4,800 | 4,800 |
| 3. | සත්කාරක නිවාස ඒකක | | 2,000 | 5,000 | 5,000 |
| 4. | සංචාරක බංගලා, කුලියට ගත් නිවාස පෞරාණික බංගලා, පෞරාණික නිවාස | | 5,000 | 5,000 | 5,000 |
| 5. | සංචාරක කුලී මහල් නිවාස | | 20,000 | 10,000 | 10,000 |
| 6. | මහල් නිවාස හෝටල් | | 40,000 | 30,000 | 30,000 |
| 7. | කුඩා සුවපහසු හෝටල් (බුටික් හෝටල්/බුටික් විලා) | කාමර 25ක් හෝ ඊට අඩු | 24,000 | 12,000 | 12,000 |
| | | කාමර 26-කාමර 50 | 24,000 | 18,000 | 18,000 |
| | | කාමර 51ක් හෝ ඊට වැඩි | 24,000 | 24,000 | 24,000 |
| 8. | ආයුර්වේද හෝටල් | | 30,000 | 20,000 | 20,000 |
| 9. | පෞරාණික හෝටල් | | 30,000 | 20,000 | 20,000 |
| 10. | ස්වාධීන සංචාරක අවන්හල් | විශේෂිත | 24,000 | 9,000 | 9,000 |
| | | අනෙකුත් | 12,000 | 6,000 | 6,000 |
| 11. | සංචාරක වෙළඳසැල් | මැණික් හා ස්වර්ණාභරණ | 24,000 | 9,000 | 9,000 |
| | | අනෙකුත් | 12,000 | 6,000 | 6,000 |
| අංකය | සංචාරක සේවා | | | | |
| 1. | සංචාරක කළමනාකරණ සමාගම් | ගමනාන්ත කළමනාකරණ සමාගම් | 24,000 | 9,000 | 9,000 |
| | | අන්තර්ජාලගත සංචාරක මෙහෙයුම්කරුවන් | 20,000 | 10,000 | 10,000 |
| | | බාහිර සංචාර මෙහෙයුම්කරුවන් | 10,000 | 5,000 | 5,000 |
| | | සංචාරක අවස්ථා කළමනාකරන සමාගම් | 40,000 | 20,000 | 20,000 |
| 2. | සංචාරක ආයුර්වේද සත්කාරක සේවා මධ්‍යස්ථාන | | 30,000 | 20,000 | 20,000 |
| 3. | සංචාරක මාර්ගෝපදේශන සේවා | ජාතික | 6,000 | 3,600 | 3,600 |
| | | රියදුරු | 6,000 | 3,600 | 3,600 |
| | | ප්‍රාදේශීය | 3,600 | 2,400 | 2,400 |
| | | විනෝද චාරිකා | 3,600 | 2,400 | 2,400 |
| | | ස්ථානීය | 3,600 | 2,400 | 2,400 |
| 4. | සංචාරක යාත්‍රා මෙහෙයුම් | | 30,000 | 20,000 | 20,000 |
| 5. | කුළු බඩු උද්‍යාන හා විකුණුම් මධ්‍යස්ථාන | | 12,000 | 6,000 | 6,000 |
| 6. | ජලාශ්‍රිත ක්‍රියාකාරකම් | ජල ක්‍රීඩා මධ්‍යස්ථාන | 24,000 | 6,000 | 6,000 |
| 7. | ස්පා සහ ශරීර සුවතා මධ්‍යස්ථාන | | 24,000 | 9,000 | 9,000 |
| 8. | වාහන සෆාරි චාරිකා මෙහෙයුම්කරුවන් | | 10,000 | 5,000 | 5,000 |
| 9. | ඇතුන්පිට-සෆාරි චාරිකා මෙහෙයුම්කරුවන් | | 5,000 | 3,000 | 3,000 |

06 - 151/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.